# 3. චිත්ත වීථිය තුළ ප්‍රපඤ්චයන් ක්‍රියාත්මක වන අයුරු




•

**පසුගිය ලිපියෙන් අපි මධුපිණ්ඩික සූත්‍රයන්ගේ ගැඹුරු අර්ථ විවරණය, එම තැන්හි පරමාර්ථ වශයෙන් උපදන සිත් සහ එම සිත් චිත්ත වීථි තුළ යෙදෙන අයුරු විස්තර කළෙමු. මෙවර ලිපියෙන් අපි මෙකී ප්‍රපඤ්චයන් ක්‍රියාත්මක වන කාලය, මනෝද්වාරවර්ජන චිත්ත වීථිය තුළ ප්‍රපඤ්චයන් ක්‍රියාත්මක වන අයුරු සහ ඉතිරි සූත්‍රපාඨ විස්තර ද දක්වන්නෙමු.**

ඒ අනුව ලෝභ සහගත සිත් 8 න් පමණක් ප්‍රපංච කිරීම සිදු වේ.
එම ප්‍රපඤ්චයන් ක්‍රියාත්මක කාලය ඉන් අනතුරුව දේශනා කෙරේ.

**“තතො නිදානං පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති අතීතානාගතපච්චුප්පන්නෙසු චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු.- ඒ චක්ෂුරූපාදී කාරණයෙන් (තෘෂ්ණාදෘෂ්ටි) ප්‍රපඤ්චයන්ගෙන් යුක්ත සංඥාකොට්ඨාසයෝ අතීතානාගතවර්තමාන වූ ඇසින් බලා දතයුතු වූ රූපයෙහි ලා පුරුෂයා අභිභවනය කෙරෙත්”**

චක්ෂුව, රූපය, චක්ඛු විඤ්ඤාණ, ඵස්ස, වේදනා, සඤ්ඤා, විතර්ක යන හේතූන් නිසා ප්‍රපඤ්ච සිදු කරයි. කවර කාරණයක් නිසාද යත් ත්‍රිවිධ පරිඤ්ඤා සම්පූර්ණ නොකරන ලද

බැවිනි. (තතොනිදානන්ති එතෙහි චක්ඛුරූපාදීහි කාරණෙහි. පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්තීති තං අපරිඤ්ඤාතකාරණං පුරිසං පපඤ්චකොට්ඨාසා අභිභවන්ති, තස්ස පවත්තන්තීති අත්ථො.)

ඤාතපරිඤ්ඤා , තීරණපරිඤ්ඤා, පහානපරිඤ්ඤා යනුවෙන් පරිඤ්ඤා 03 කි.

1 නාමරූප ව්‍යවස්ථාපනය ඤාතපරිඤ්ඤාවයි.
2 කලාප සම්මර්ෂණයේ පටන් අනුලෝම ඤාණය දක්වා තීරණපරිඤ්ඤාවයි.
3 ආර්යමාර්ග සඞ්ඛ්‍යාත ඤාණය පහානපරිඤ්ඤාවයි.
(*නාමරූපවවත්ථානං වා ඤාතපරිඤ්ඤා. කලාපසම්මසනාදිඅනුලොමපරියොසානා තීරණපරිඤ්ඤා. අරියමග්ගෙ ඤාණං පහානපරිඤ්ඤාති – මජ්ඣිමනිකායට්ඨකථා, මූලපරියායසුත්තවණ්ණනා*)

'මෙවැනි ප්‍රපඤ්චයන්ගෙන් යුත් සංඥා කොට්ඨාශ අතීත අනාගත වර්තමාන වූ ඇසින් බලා දත යුතු වූ රූපයෙහි ලා පුරුෂයා අභිභවනය කෙරෙත්' යන්නෙහි අදහස නම් වර්තමානයේ චක්ඛු ද්වාරික ව උපන් ප්‍රපඤ්චය චක්ඛුවද, රූපයන්ද, ඵස්ස, වේදනා, සඤ්ඤා, විතර්ක නිසා උපදනේද අතීත – අනාගත කාලයන්හිද ඇසින් දකින රූපයන්හි මෙම ක්‍රියාවලිය සිදු වූ බව සිදුවන බව දැක්වීමයි.
මෙම ක්‍රමය සෝත, ඝාන, ජිව්හා, කාය යන ද්වාරයන් සඳහාද යෙදෙන ආකාරය මහාකච්චායන මහරහතන් වහන්සේ මෙසේ දේශනා කරයි.

**"සොතඤ්චාවුසො, පටිච්ච සද්දෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණං...පෙ.... ඝානඤ්චාවුසො, පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති ඝානවිඤ්ඤාණං...පෙ.... ජිව්හඤ්චාවුසො, පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං...පෙ.... කායඤ්චාවුසො, පටිච්ච ඵොට්ඨබ්බෙ ච උප්පජ්ජති කායවිඤ්ඤාණං...පෙ....... තිණ්ණං සඞ්ගති ඵස්සො,ඵස්සපච්චයා වෙදනා, යං වෙදෙති තං සඤ්ජානාති, යං සඤ්ජානාති තං විතක්කෙති, යං විතක්කෙති තං පපඤ්චෙති, යං පපඤ්චෙති තතොනිදානං පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති අතීතානාගතපච්චුප්පන්නෙසු කායවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු"**

"ඇවැත්නි, කණ ද ශබ්දයන් ද නිසා ශොත්‍රවිඥානය උපදී ... ඇවැත්නි, නැහැය ද ගඳ ද නිසා ඝ්‍රාණවිඥානය උපදී ... ඇවැත්නි, දිව ද රසයන් ද නිසා ජිව්හාවිඥානය උපදී ... ඇවැත්නි, කය ද ස්ප්‍රෂ්ටව්‍යයන් ද නිසා කායවිඥානය උපදී ... .......මේ තිදෙනාගේ එක්වීමෙන් ස්පර්ශය වෙයි. ස්පර්ශය නිසා වෙදනාව වෙයි. යමක් විඳී ද එය හඳුනයි. යමක් හඳුනා ද එය විතර්කණය කෙරෙයි. යමක් විතර්කණය කෙරේ ද එය ප්‍රපඤ්චයට පමුණුවයි. යමක් ප්‍රපඤ්චයට පමුණුවා නම් ඒ කායස්පර්ශාදි කාරණයෙන් ප්‍රපඤ්චසංඥා

කොට්ඨාසයෝ අතීතානාගතවර්තමාන වූ කයින් දතයුතු වූ ධර්මයන්හි පුරුෂයා අභිභවනය කෙරෙත්.”

ඉන් අනතුරුව මනෝද්වාරයෙහි ප්‍රපඤ්ච සිදුකෙරෙන ආකාරය දක්වයි.

**මනඤ්චාවුසො, පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, යං වෙදෙති තං සඤ්ජානාති, යං සඤ්ජානාති තං විතක්කෙති, යං විතක්කෙති තං පපඤ්චෙති, යං පපඤ්චෙති තතොනිදානං පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති අතීතානාගතපච්චුප්පන්නෙසු මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු**

‘සිත ද ධර්‍මයන් ද නිසා මනෝවිඥානය උපදී. මේ තිදෙනාගේ එක්වීමෙන් ස්පර්ශය වෙයි. ස්පර්ශය නිසා වෙදනාව වෙයි.
මෙහි “මනං” යනු භවාංග චිත්තයයි. “ධම්මෙ” යනු කාම රූප අරූප යන ත්‍රෛභූමික පරියාපන්න වූ ධම්මාරම්මණයයි.

මනෝවිඤ්ඤාණය ආකාර 02කට පැහැදිලි වේ,

(i) ආවර්ජනය චිත්තය මනෝ විඤ්ඤාණය ලෙස සැලකීම
ආවර්ජන චිත්තය මනෝ විඤ්ඤාණය ලෙස සැළකූ විට ඵස්සය, වේදනාව , විතර්කය ආවර්ජන චිත්තය සමඟ සහජාත වූ ඒවා වෙත් . ප්‍රපඤ්ච ඉන් අනතුරුව උපදින ජවන සහජාත වූ එවා වේ.

(ii) ජවන චිත්තය මනෝ විඤ්ඤාණය ලෙස සැළකූ විට ආවර්ජන චිත්තය සහ භවාංග සිත “මනෝ” නම් වේ . ඵස්ස, වේදනා, විතර්ක සහ ප්‍රපඤ්ච ජවන සහ ජාත වූ ඒවා වෙත්.
*(ඡට්ඨද්වාරෙ පන **මනන්ති** භවඞ්ගචිත්තං. ධම්මෙති තෙභූමකධම්මාරම්මණං. **මනොවිඤ්ඤාණන්ති** ආවජ්ජනං වා ජවනං වා. ආවජ්ජනෙ ගහිතෙ ඵස්සවෙදනාසඤ්ඤාවිතක්කා ආවජ්ජනසහජාතා හොන්ති. පපඤ්චො ජවනසහජාතො. ජවනෙ ගහිතෙ සහාවජ්ජනකං භවඞ්ග මනො නාම හොති, තතො ඵස්සාදයො සබ්බෙපි ජවනෙන සහජාතාව.)*
මනෝද්වාරයෙහි අතීත, අනාගත, වර්තමාන යන ත්‍රෛකාලික වූ සියළු දෑ අරමුණු කරමින් සිත් උපදී.

ඉහත සූත්‍ර පාඨය මනෝද්වාරික චිත්ත වීථියකින් (පළමු නය ක්‍රමයෙන්)




**"සො වතාවුසො, චක්ඛුස්මිං සති රූපෙ සති චක්ඛුවිඤ්ඤාණෙ සති ඵස්සපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – ඨානමෙතං විජ්ජති. ඵස්සපඤ්ඤත්තියා සති වෙදනාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – ඨානමෙතං විජ්ජති. වෙදනාපඤ්ඤත්තියා සති සඤ්ඤාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – ඨානමෙතං විජ්ජති. සඤ්ඤාපඤ්ඤත්තියා සති විතක්කපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – ඨානමෙතං විජ්ජති."**

'ඇවැත්නි, එකාන්තයෙන් හෙතෙමේ ඇස ඇති කල්හි රූපය ඇති කල්හි චක්ෂුර්විඥානය ඇති කල්හි ස්පර්ශ යැ යි පැනවීමක් කරන්නේ ය (උපදනේය) යන මේ කාරණය විද්‍යමාන වෙයි. ස්පර්ශ යැ යි පැනවීමක් ඇති කල්හි වෙදනා යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි. වෙදනා යැ යි පැනවීමක් ඇති කල්හි සංඥා යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි. සංඥා යැ යි පැනවීමක් ඇති කල්හි විතර්කයැ යි පැනවීමක් කරන්නේය යන මේ කාරණය විද්‍යමාන වේ. විතර්ක යැයි පැනවීමක් ඇති කල්හි ප්‍රපඤ්චසංඥාකොට්ඨාසයන්ගේ පැවැත්ම පිළිබඳ පැනවීමක් කරන්නේය යන මේ කාරණය විද්‍යමාන වේ.'

අර්ථකථාව නොසළකා **'චක්ඛුස්මිං සති රූපෙ සති චක්ඛුවිඤ්ඤාණෙ සති ඵස්ස පඤ්ඤත්තිං පඤ්ඤපෙස්සති'** යන්නෙහි වචනාර්ථ පමණක් සැළකුවහොත් 'ඇස ඇති කල්හි රූපය ඇති කල්හි චක්ෂුර්විඥානය ඇති කල්හි ස්පර්ෂය යැයි පැනවීමක් කරන්නේය' යැයි කීමට සිදුවේ. (Counter) නමුත් මින් අදහස් කරනුයේ "ඵස්සය නම් එක් ධර්මයක් උපදීය මෙසේ ඵස්සප්‍රඥප්තියක් පනවන්නේය දක්වන්නේය" යන්නයි.
(***ඵස්සපඤ්ඤත්තිංපඤ්ඤපෙස්සතීති*** *ඵස්සො නාම එකො ධම්මො උප්පජ්ජතීති එවං ඵස්සපඤ්ඤත්තිං පඤ්ඤපෙස්සති,දස්සෙස්සතීති අත්ථො.)*

**"සො වතාවුසො, සොතස්මිං සති සද්දෙ සති...පෙ.... ඝානස්මිං සති ගන්ධෙ සති...පෙ.... ජිව්හාය සති රසෙ සති...පෙ.... කායස්මිං සති ඵොට්ඨබ්බෙ සති...පෙ.... මනස්මිං සති ධම්මෙ සති මනොවිඤ්ඤාණෙ සති ඵස්සපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – ඨානමෙතං විජ්ජති. ඵස්සපඤ්ඤත්තියා සති වෙදනාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – ඨානමෙතං විජ්ජති. වෙදනාපඤ්ඤත්තියා සති සඤ්ඤාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – ඨානමෙතං විජ්ජති. සඤ්ඤාපඤ්ඤත්තියා සති විතක්කපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – ඨානමෙතං විජ්ජති. විතක්කපඤ්ඤත්තියා සති පපඤ්චසඤ්ඤාසඞ්ඛාසමුදාචරණපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – ඨානමෙතං විජ්ජති."**

'ඇවැත්නි, එකාන්තයෙන් මෙතෙමේ කණ ඇති කල්හි ශබ්දය ඇති කල්හි සොතවිඤ්ඤාණය ඇති කල්හි ... නැහැය ඇති කල්හි ගඳ ඇති කල්හි ඝානවිඤ්ඤාණය ඇති කල්හි ... දිව ඇති කල්හි රසය ඇති කල්හි ජිව්හාවිඤ්ඤාණය ඇති කල්හි ... කය ඇති කල්හි ස්ප්‍රෂ්ටව්‍යය ඇති කල්හි කායවිඤ්ඤාණය ඇති කල්හි ... සිත ඇති කල්හි ධර්මය ඇති කල්හි මනොවිඤ්ඤාණය ඇති කල්හි ස්පර්ශ යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි. ස්පර්ශ යැ යි පැනවීමක් ඇති කල්හි වෙදනා යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි. වෙදනා යැ යි පැනවීමක් ඇති කල්හි සංඥා යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි. සංඥා යැ යි පැනවීමක් ඇති කල්හි විතර්ක යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි. විතර්ක යැයි පැනවීමක් ඇති කල්හි ප්‍රපඤ්චසංඥාකොට්ඨාසයන්ගේ පැවැත්ම පිළිබඳ පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන වෙයි.'

ආයතන නිරෝධය

ඉහත ධර්ම පාඨවලින් අදහස් කරනුයේ සංසාර වෘත්තයයි. ආයතන ඇති කල්හි ආයතනයන්ගේ ස්වකීය කාර්යය වන සංසාරය දිගු කිරීම නොනවත්වා සිදුවේ .
මෙය ඇතිකල්හි මෙය වේ යැයි ද්වාදසආයතන වශයෙන් සංසාර වෘත්තය දක්වා ඉන් අනතුරුව ද්වාදසආයතන ප්‍රතික්ෂේප කරමින් විවට්ටය දක්වමින් මෙසේ වදාළ සේක. (*එවං ඉමස්මිං සති ඉදං හොතීති ද්වාදසායතනවසෙන සකලං වට්ටං දස්සෙත්වා*

*ඉදානි ද්වාදසායතනපටික්ඛෙපවසෙන විවට්ටං දස්සෙන්තො සො වතාවුසො චක්ඛුස්මිං අසතීති දෙසනං ආරභි.)*

**''සො වතාවුසො, චක්ඛුස්මිං අසති රූපෙ අසති චක්ඛුවිඤ්ඤාණෙ අසති ඵස්සපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – නෙතං ඨානං විජ්ජති. ඵස්සපඤ්ඤත්තියා අසති වෙදනාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – නෙතං ඨානං විජ්ජති. වෙදනාපඤ්ඤත්තියා අසති සඤ්ඤාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – නෙතං ඨානං විජ්ජති. සඤ්ඤාපඤ්ඤත්තියා අසති විතක්කපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – නෙතං ඨානං විජ්ජති. විතක්කපඤ්ඤත්තියා අසති පපඤ්චසඤ්ඤාසඞ්ඛාසමුදාචරණපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – නෙතං ඨානං විජ්ජති.''**

'ඇවැත්නි, එකාන්තයෙන් හෙතෙමේ ඇස නැති කල්හි රූපය නැති කල්හි චක්ෂුර්විඥානය නැති කල්හි ස්පර්ශ යැයි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි. ස්පර්ශ යැ යි පැනවීමක් නැති කල්හි වෙදනා යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි. වෙදනා යැයි පැනවීමක් නැති කල්හි සංඥා යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි. සංඥා යැ යි පැනවීමක් නැති කල්හි විතර්ක යැයි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි. විතර්ක යැ යි පැනවීමක් නැති කල්හි ප්‍රපඤ්චසංඥාකොට්ඨාසයන්ගේ පැවැත්ම පිළිබඳ පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි.'

මෙහි ඇස නැති කල්හි රූපය නැති කල්හි චක්ෂුර්විඥානය නැති කල්හි ස්පර්ශ යැයි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යමාන නො වෙයි යනාදී ලෙස දක්වනුයේ නිර්වාණය අවබෝධ කරගැනීම හේතුවෙන් සසර දිගුකෙරෙන චක්ඛු ආදී ආයතනවල ආයතන කෘත්‍යය නතර වීමෙන් කර්ම රැස් නොවීමයි. සසර ගමන නතර වීමයි. සර්වාකාරයෙන් ආයතන පිරිසිඳ අවබෝධ කරගත් නිසා රහතන්වහන්සේට චක්ඛු ආදිය නිසා ඵස්සය,වේදනාව,සඤ්ඤාව,විතර්කය පහළ වුවද ප්‍රපඤ්ච රැස් නොවේ. යමෙක් හුදු වචනාර්ථයෙහි පිහිටා ඇස, රූපය, චක්ඛු විඤ්ඤාණය නැති කල්හි ඵස්සාදිය නූපදී යනුවෙන් අර්ථ ගතහොත් ද නිවන් දැකීම අඳබිහිරි පුද්ගලයන් හටම සිදුවන්නක් විය යුතුය.

**''සො වතාවුසො, සොතස්මිං අසති සද්දෙ අසති...පෙ.... ඝානස්මිං අසති ගන්ධෙ අසති...පෙ.... ජිව්හාය අසති රසෙ අසති...පෙ.... කායස්මිං අසති ඵොට්ඨබ්බෙ අසති...පෙ.... මනස්මිං අසති ධම්මෙ අසති මනොවිඤ්ඤාණෙ අසති ඵස්සපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – නෙතං ඨානං විජ්ජති. ඵස්සපඤ්ඤත්තියා අසති වෙදනාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – නෙතං ඨානං විජ්ජති. වෙදනාපඤ්ඤත්තියා අසති සඤ්ඤාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – නෙතං ඨානං විජ්ජති. සඤ්ඤාපඤ්ඤත්තියා අසති විතක්කපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – නෙතං ඨානං විජ්ජති.**

**විතක්කපඤ්ඤත්තියා අසති පපඤ්චසඤ්ඤාසඞ්ඛාසමුදාචරණපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති – නෙතං ඨානං විජ්ජති.''**

" ඇවැත්නි, එකාන්තයෙන් හෙතෙමේ කණ නැති කල්හි ශබ්දය නැති කල්හි සොතවිඤ්ඤාණය නැති කල්හි ... නැහැය නැති කල්හි ගඳ නැති කල්හි ඝාන විඤ්ඤාණය නැති කල්හි ... දිව නැති කල්හි රසය නැති කල්හි ජිව්හාවිඤ්ඤාණය නැති කල්හි ... කය නැති කල්හි ස්ප්‍රෂ්ටව්‍යය නැති කල්හි කායවිඤ්ඤාණය නැති කල්හි ... සිත නැති කල්හි ධර්ම නැති කල්හි මනොවිඤ්ඤාණය නැති කල්හි ස්පර්ශ යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යාමාන නො වෙයි. වෙදනා යැ යි පැනවීමක් නැති කල්හි සංඥා යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යාමාන නො වෙයි. සංඥා යැයි පැනවීමක් නැති කල්හි විතර්ක යැ යි පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යාමාන නො වෙයි. විතර්ක යැ යි පැනවීමක් නැති කල්හි ප්‍රපඤ්චසංඥාකොට්ඨාසයන්ගේ පැවැත්ම පිළිබඳ පැනවීමක් කරන්නේ ය යන මේ කාරණය විද්‍යාමාන නො වෙයි."

මෙසේ බුදුපියාණන් වහන්සේ විසින් සංක්ෂේපයෙන් දේශනා කොට වදාළා වූ ධර්මය විස්තර කොට එතැනින් නොනැවතී තම නිහතමානී ගුණය ප්‍රකට කරමින් මහකච්චායන මහරහතන් වහන්සේ මෙසේ සඟ පිරිසට ප්‍රකාශ කළහ.

"ඇවැත්නි, අපගේ භාග්‍යවතුන් වහන්සේ "මහණ, යම් කරුණෙකින් ප්‍රපඤ්චසංඥා කොට්ඨාසයෝ පුරුෂයා තුළ පවතිත් ද, ඉදින් මේ කරුණෙහි (ද්වාදශායතනයන්හි) සතුටුවිය යුත්තෙක් කියා යුත්තෙක් ගිල ගතයුත්තෙක් නැත් නම් මෙය ම (අභිනන්දනාදිය නැති බව ම) රාගානුසයයන්ගේ කෙළවර ය ... මේ ද්වාදශායතනයන්හි මේ ලාමක අකුශල ධර්මයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත්'' යන මේ උද්දේශයක් සැකෙවින් උදෙසා විස්තර විසින් අරුත් නො බෙදා හුනස්නෙන් නැගිට විහාරයට වැඩි සේක් ද, ඇවැත්නි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසූ විස්තර විසින් අරුත් නො බෙදූ මේ උද්දෙශයාගේ විස්තර විසින් අර්ථය මෙසේ දනිමි. ආයුෂ්මත්නි, තෙපි කැමතියවුහු නම් භාග්‍යවතුන් වහන්සේ වෙත ම එළඹ මේ අර්ථය පුළුවුස්ව. අපගේ භාග්‍යවතුන් වහන්සේ යම් සේ වදාරනසේක් නම් එය එසේ ධරව යි."

සඟ පිරිස මහාකච්චායන මහරහතන් වහන්සේ සමඟ කල සාකච්ඡාව බුදුරජාණන් වහන්සේට සැළකල පසුව එම දේශනාවේ විශිෂ්ටත්වය අගයමින් මෙසේ වදාළහ.

**''පණ්ඩිතො, භික්ඛවෙ, මහාකච්චානො; මහාපඤ්ඤො, භික්ඛවෙ, මහාකච්චානො. මං චෙපි තුම්හෙ, භික්ඛවෙ,එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ, අහම්පි තං එවමෙවං බ්‍යාකරෙය්‍යං යථා තං මහාකච්චානෙන බ්‍යාකතං. එසො චෙවෙතස්ස අත්ථො. එවඤ්ච නං ධාරෙථා''ති.''**

“මහණෙනි, මහාකාත්‍යායන තෙමේ පණ්ඩිතය. මහණෙනි, මහාකාත්‍යායන තෙමේ මහනුවණැත්තේ ය. මහණෙනි, තෙපි මාගෙන් වුවත් මේ අර්ථය පිළිවිසුවහු නම් මහාකාත්‍යායනයා විසින් යම්සේ එය ප්‍රකාශ කරන ලද නම් මම ද තොපට එය එසේ ම ප්‍රකාශ කරන්නෙමි. මෙහි අර්ථය මේ ම ය. එසේ ම දරව.”

මෙසේ වදාළ කල්හි ආනන්ද හිමි භාග්‍යවතුන් වහන්සේට මෙසේ ප්‍රකාශ කළහ.

‘වහන්ස බඩසා දුබල බැවින් පෙළුණු පුරුෂයෙක් මිහිරි කිරීමට අමුතු රස නො ඉසිය යුත් මීපිඩුවක් (බදහත්වටක්) ලබා ද, හෙතෙමේ යම් යම් පසෙකින් (එය) ආස්වාදනය කෙරේ ද (ඒ ඒ පැත්තෙන්) මිහිරි රසයක් ලබන්නේ ම ය. වහන්ස එ පරිද්දෙන් ම සිතන සැහැවි ඇති පණ්ඩිත ස්වභාව ඇති මහණෙක් යම් යම් ලෙසෙකින් මේ ධර්මදෙශනාවගෙ අර්ථය නුවණින් පරීක්ෂා කරන්නේ ද ඒ ඒ ලෙසින් සතුටුබව ලබන්නේ ම ය සිතේ පැහැදී ම ලබන්නේ ම ය වහන්ස, මේ ධර්මපර්යාය ය කිනම් ඇත්තේ ද? ආනන්දය, එසේ නම් තෝ මෙහි ලා මේ ධර්මදෙශනාව මධුපිණ්ඩිකපර්යාය යැ යි දරව යි වදාළ සේක.’

මෙම සූත්‍රයට මධුපිණ්ඩික සූත්‍රය යන නම ලැබුනේ ආනන්ද ස්වාමින්වහන්සේගේ ඉහත ප්‍රකාශය හේතුවෙනි.